# ජයතිලක කම්මැල්ලවීරගේ කෙටිකතාවල කලාත්මක විකාසනය

ජේ. කුමාරසිංහ

80 දශකය ආරම්භයේ දී කෙටිකතාකරණයට පිවිසි ජයතිලක කම්මැල්ලවීර සැබෑ ප්‍රතිභාවකින් යුත් දක්ෂ කෙටිකතාකරුවෙකි. කෙටිකතාව නමැති අභිප්‍රකාශන කලා මාධ්‍යය සිය ජීවිත අත්දැකීම් හා සමාජ ජීවිතයෙන් උකහාගත් අත්දැකීම් ගැඹුරින් නිරූපණය කිරීමට උචිත ලෙස හැසිරවීමේ අපූර්ව කුසලතාවක් ඔහු විසින් ප්‍රකට කෙරිණි. අත්දැකීමක් සෑම අංශයකින් ම විශ්ලේෂණය කර එහි පත්ලට කිඳා බැස යථාර්ථය ග්‍රහණය කර ගැනීමට ඔහු තරම් කෙටිකතාව හැසිරවීමේ චාතුර්යයක් ප්‍රකට කළ වෙනත් ලේඛකයකු 80 දශකය තුළ නොසිටි තරම් ය. ඔහු කෙටිකතාව සම්ප්‍රදායත්, නවීනත්වයත් අතර මනා ලෙස මුසු කිරීමට පෙළඹුණේය. සම්ප්‍රදාය ඛණ්ඩනය කිරීමට හෝ අභියෝගයට ලක්කිරීමට ඔහු නොපෙළඹුණේය. ඔහු විශේෂ සම්ප්‍රදායගරුක ලේඛකයෙක් විය. නමුත් විශේෂ සම්ප්‍රදාය තුළ සිට - නව අත්හදාබැලීම් කිරීමට, නව ශිල්ප ක්‍රම උපයෝගී කර ගැනීමට නැඹුරු වූයේය. සම්බන්ධ කලා මාධ්‍යයකට ලේඛකයකුට සිය අනන්‍යතාව රැඳවිය හැකි සේවයක් කළ හැක්කේ හැකිතාක් දුරට අත්හදාබැලීම්වල නිරත වීමෙනි. ජයතිලක කම්මැල්ලවීර කතා සංග්‍රහයෙන් සංග්‍රහයට එබඳු අත්හදා බැලීම්වල නිරත වූයේය. එමගින් ඔහු සිය කුසලතා ප්‍රකට කළේය. සිය අනන්‍යතාව රැඳවූයේය. මේ නිසා ම ඇතැම් විචාරකයෙක් ඔහු සම්ප්‍රදායගරුක හා සම්ප්‍රදාය තුළ කෙටිකතාවේ නිම්වළලු පුළුල් කළ ලේඛකයෙකු ලෙස හඳුන්වා දීමට පුළුවන. එසේ ම ඔහු සම්ප්‍රදායානුකූල කෙටිකතාව නවීනත්වයෙන් විභූෂණය කළ ලේඛකයකු ලෙස ද නම් කළ හැකිය. ඇතැම් විට සම්ප්‍රදායගරුක ලෙස නවීනත්වය සිංහල කෙටිකතාවට ආරෝපණය කළ ලේඛකයකු ලෙස ද පෙනිය හැකිය. කෙසේ වුව ද ජයතිලක කම්මැල්ලවීර සිංහල කෙටිකතාව අත්දැකීම් ක්ෂේත්‍රයෙන් ද, කතා කලාවෙන් ද, රචනා රීතියෙන් ද, භාෂාව අපූර්ව ලෙස පරිහරණය කිරීමෙන් ද, පෝෂණය කළ ලේඛකයෙකි.

ඔහුගේ මුල් ම කතා සංග්‍රහය වන්නේ 1983 දී රචනා කරන ලද **කළු සපත්තු** ය.[1] ආධුනිකයකු ලෙස කෙටිකතාකරණයට පිවිසි ජයතිලකගේ නිර්මාණ කුසලතා මෙන් ම දුර්වලතා ද හඳුනා ගැනීමට සුදුසු ලෙස කෙටිකතාවක් ලෙස **ජයසිරිගේ කතාව** දැක්විය හැකිය. සම්ප්‍රදාය තුළ තරුණ ජයතිලක කෙබඳු කුසලතා ප්‍රකට කළේ ද යනු මේ කතාව විමර්ශනයෙන් හඳුනා ගැනීමට පුළුවන. පියා අහිමි ළාබාල තරුණයකුගේ ජීවන ශෝකාන්තයෙන් සිදුවක් නිරූපණය කිරීම අරමුණු කර ගත් නිර්මාණයක් ලෙස **ජයසිරිගේ කතාව** හඳුනා ගත හැකිය. පියාගේ හදිසි